# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2291/32 - 2022 අගෝස්තු මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2022.08.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/6/2018/එච්ඩබ්/452.
*මගේ අංකය* : කේපීආර්/එල්එන්ඩී/ඒසීකිවුවීඅයි/01/25-X.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 327බී වලකන්ද නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බජ්ජන්කැලේ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවෙන් මාතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක මාර 2881 හා 2022.02.22 දිනැති සැලැස්මේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0532 ක් වූ පහත දැක්වෙන ඉඩම් කොටස් 03:

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: පුංචිමුලණ; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කොඩිතුවක්කුගේ පියදාස ( ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ 06 වන වගන්තිය අනුව අත්කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0068.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: කන්දපල්ල; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සුනිල් කොඩිතුවක්කු ( ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ 06 වන වගන්තිය අනුව අත්කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0142.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: බඹරවැල්කැටිය; ඉඩමේ විස්තරය: රක්ෂිතය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: - ( දක්ෂිණ අධිවේගී මාර්ගය (දකුණු කොටස දිගුව) සඳහා වෙන් කර ඇත); ප්‍රමාණය: හෙක්. 0.0322.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 අගෝස්තු මස 29 දින, පූ.භා. 10.00ට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ වියයුතුයි.

තවද, 2022 අගෝස්තු මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලු හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වු ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරි,
කිරින්ද පුහුල්වැල්ල.

2022 අගෝස්තු මස 04 වැනි දින,
ප්‍රාදේශිය මහලේකම් කාර්යාලය,
කිරින්ද පුහුල්වැල්ල.

EOG 08-0034

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.